# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1921/3 - 2015 ජුනි මස 29 වැනි සඳුදා - 2015.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

64 (1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 64 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, හක්මන ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන හක්මන ජල සම්පාදන ක්‍රමයේ ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63(1) වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධි විධාන මෙම නියමය මගින් මෙහි පහත උපලේඛනයේ ඇතුළත් කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 ජුනි මස 26 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

#### උපලේඛනය

61 (1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ :

(අ) පහත දැක්වෙන සියළුම චංචල හා නිශ්චල දේපල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය සතු කළ යුතුය. එනම් :

(i) 1 වන උපලේඛනයේ ලේඛන ගත කර ඇති ස්ථානවල පිහිටි සියළුම ජල මූලාශ්‍ර, ජල කුළුණු, පීඩන සිදින ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම ඉඩම්, ගොඩනැගිලි, ජල නල සියළුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවිකිරීම් ද, යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම අමතර කොටස් අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය.

(ii) හක්මන ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි ජලය බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය ජල නල මාර්ගවල පරවශතාවයන්, අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය සමග සියළුම ප්‍රධාන ජල නල බෙදහැරීමේ ජල නල මාර්ග.

(ආ) ඉහත සඳහන් දේපල හා සම්බන්ධව සැලසුම් කිරීම, සවි කිරීම්, ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව හක්මන ප්‍රාදේශීය සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තු ද, සභාවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරණු ලැබේ.

(ඇ) ජලය භාවිතා කිරීම හා ජල සේවා සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයන් සමග හක්මන ප්‍රාදේශීය සභාව බැඳී අති සියළුම ගිවිසුම්ද, ඒ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් කළ යුතු ගෙවීම්ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 3,831,730/- ක් (රුපියල් තිස් අට ලක්ෂ තිස් එක් දහස් හත්සිය තිහක්) වටිනා මේ පහසුකම්වල වත්කම් ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ඇතුළත් වූ සියළුම ගිවිසුම් මණ්ඩලය විසින් නොකඩවා පවත්වා ගෙන යනු ලබන අතර, ගිවිසුම් සපුරාලීමද කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළවූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

*උපලේඛනය අංක 01*

| අනු අංකය | විස්තරය | ඉඩම පිහිටීම | ප්‍රමාණය | | | මිනින්දෝරු සැලසුම් අංකය | හිමිකම් ඔප්පු විස්තරඃ |
|---|---|---|---|---|---|---|---|
| | | | අක් : | රූඩ් : | පර්චඃ | | |
| 01. | හක්මන ජල පවිත්‍රාගාරය හා පොම්පාගාරය පිහිටි ඉඩම. | මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේපත ඉර නැමති ගමේ පිහිටි පහල බිබුලේ කුඹුර නැමති ඉඩම. | - | - | 9.75 | එච්.කේ.ඒ. හේමචන්ද්‍ර බලයලත් මිනින්දෝරුගේ අංක 14/032 දරන සැලැස්මේ කොටසක්. | හක්මන ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳිනු ලබන දේපලකි. |
| 02. | හක්මන වලස්මුල්ල පාරේ ජල පොම්පාගාරය පිහිටි ඉඩම. | මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුතාමුරේ නැමති ගමේ පිහිටි මිකින්දවෙල නැමති ඉඩම. | - | - | 6.92 | එච්.කේ.ඒ. හේමචන්ද්‍ර බලයලත් මිනින්දෝරුගේ අංක 14/034 දරන සැලැස්මේ කොටසක්. | හක්මන ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳිනු ලබන දේපලකි. |
| 03. | මුරුතාමුරේ ජල පොම්පාගාරය පිහිටි ඉඩම. | මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුතාමුරේ නැමති ගමේ පිහිටි කරුවගොඩ සහ වන්නිආරච්චිගේ කැබැල්ල නැමති ඉඩම. | - | - | 9.88 | එච්.කේ.ඒ. හේමචන්ද්‍ර බලයලත් මිනින්දෝරුගේ අංක 14/035 දරන සැලැස්මේ කොටසක්. | හක්මන ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳිනු ලබන දේපලකි. |

07 - 613

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.